## විසර්ජන ශීර්ෂය - 267
## මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන උප දිසාපති කාර්යාල වල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010**

### 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(i) දිළිදුකම දුරලීමේ මුලාරම්භයන් ව්‍යාප්ත කිරීම හා කළමනාකරණය
(ii) ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය
(iii) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා පාලනය
(iv) මැතිවරණ සම්බන්ධීකරණය
(v) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා මගපෙන්වීම
(vi) ආදායම රැස්කිරීම

### 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති උප දිසාපති කාර්යාල

(අ) මරිටයිම්පත්තු
(ආ) ඔඩ්ඩුසුඩාන්
(ඇ) මන්තායි නැගෙනහිර
(ඈ) තුනුක්කායි
(ඉ) පුතුකුඩුඉරිප්පු

මෙම උප දිසාපති කාර්යාල 2011 ජනවාරි 01 සිට බල පැවැත්වෙන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලෙස උසස් කර ඇත.

### 3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගිණුම් වර්ෂය ආරම්භයේදී ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4. ගිණුම්

#### 4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වු උප දිසාපති කාර්යාල 5 ක් සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.99,395,000 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.95,848,813

ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා උප දිසාපති කාර්යාල වල ශුද්ධ ඉතිරි කිරීම් රු.3,546,187 ක් වු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 3.57% ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන | 68,625,000 | 68,625,000 | 66,142,553 | 2,482,447 | 3.62 |
| මූලධන | 30,770,000 | 30,770,000 | 29,706,260 | 1,063,740 | 3.46 |
| එකතුව | 99,395,000 | 99,395,000 | 95,848,813 | 3,546,187 | 3.57 |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු.362,796,152 ක් වු ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය (2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 65,417 | 61,547 | 3,870 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 1,365 | 1,178 | 187 |
| 117 | මහා මාර්ග අමාත්‍යාංශය | 9,504 | 9,043 | 461 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 72 | 46 | 26 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 75 | 52 | 23 |
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 5,773 | 4,697 | 1,076 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 978 | 936 | 42 |
| 140 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 500 | 410 | 90 |

| | | | | |
|---|---|---|---|---|
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 124,063 | 122,439 | 1,624 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 276 | 264 | 12 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 7,275 | 7,231 | 44 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 283 | 247 | 36 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 533 | 424 | 109 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 144,892 | 78,808 | 66,084 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 1,790 | 1,337 | 453 |
| | එකතුව | 362,796 | 288,659 | 74,137 |

## 4.3 විගණනය හා විගණන විෂය පථය

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 අගෝස්තු 18 දින මුලතිව් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය වාර්තා හා පොත් අනුව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙම වාර්තාවේ (අ) සිට ( ඈ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.12 දක්වා වු ඡේද වල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය / විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 267 | විසර්ජන ගිණුම |
| 26701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබූ අතර වෙනත් සමහර ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අදාල රීති හා රෙගුලාසි වලට අනුකූලව මෙම ලේඛන පවත්වා ගෙනයාමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | පරිගණක , උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | |
| (ඇ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | |
| (ඈ) | පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 | |

(iii) එකතුව රු.283,910 ක් වු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනදෙනු ලබාගන්නාගේ අත්සන , ටෙන්ඩර් තොරතුරු , අනුමැතිය , සතුටුදායක වාර්තා , ටෙන්ඩර් පරිපාටිය ආදි සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**(ආ) අයවැය විචලනය**

ශීර්ෂ 267 වැය විෂය අංක 1-1-0-1404 යටතේ ප්‍රතිපාදනය කරන ලද රු.50,000 ක සමස්ථ ප්‍රතිපාදනය ඉතිරිවී තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

(i) වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ රු.174,161 ක හිමිකම් නොපෑ තැන්පතු ශේෂයන් පිළිබඳව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) තැන්පතු ගිණුම් ශේෂයන් පිළිබඳව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2010 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවතුණු ශේෂ එකතුව රු.558,480 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්තවයක පැවතුණි.

## 4.6 වත්කම් කළමනාකරණය

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල වාර්තා කරන ලද අතිරික්තතා හා ඌනතා සහ වෙනත් නිර්දේශයන් පිළිබඳව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 756 හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක 436 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා උප දිසාපති කාර්යාල වල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නියමිත දිනට පැවැත්විය යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා උප දිසාපති කාර්යාල වල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ චක්‍රලේඛයේ නියම කර ඇති දිනට මාස දෙකක් ගතවීමෙන් පසු සිදුකර තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 කට අඩු කාලයක් පැවතුණු බේරුම් නොකළ බැරකම් රු.108,767 ක් විය. පහත නිරීක්ෂණයද කරනු ලැබේ.

* ප්‍රවර්ථන වර්ෂයේ රු.108,767 ක් වූ බැරකම් පසු වර්ෂයේ බේරුම් කර තිබුණද එම බැරකම් 2010 වර්ෂයේ බැරකම් ලැයිස්තුවේ ඇතුළත් කර නොතිබුණි.

## 4.7 අනුකූල නොවීම්

### (අ) නීති , රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති , රීති , හා රෙගුලාසි වල විධිවිධානයන්ට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 වගන්තිය | 804,164 | තාක්ෂණ ඇගයීම් කමිටුවේ එක් සාමාජිකයකු වාර්තාවේ අත්සන් කර නොතිබුණි. |
| (ii) | **මුදල් රෙගුලාසි** | | |
| | මුදල් රෙගුලාසි අංක 104(3) සහ (4) | 45,977,461 | ගැටුම් පැවති කාලයේදී සිදුවූ පාඩු හා හානි විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි අංක 237(අ) | 6,845,312 | ඉදිකිරීම් වැඩ නිම කිරීමට පෙර ගෙවීම් සිදුකර තිබුණි. |
| (iii) | **චක්‍රලේඛ විධිවිධාන** | | |
| | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| | (අ) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | 2010 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ආ) 2006 මාර්තු 24 දිනැති අංක 28 දරන ජාතික අයවැය චක්‍රලේඛය | - | 2010 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

* 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට පටහැනිව රු.31,669 ක් වූ රඳවා ගැනීම් බදු මිලදී ගැනීම් වලදී අයකර ගෙන නොතිබුණි.

## 4.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භකළ දිනය | නිම කිරීමට නියමිත දිනය | දෙසැම්බර් 31 දක්වා වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| 1. මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල නිවාසයේ සීමා තාප්පය අළුත් වැඩියා කිරීම | 1,600,000 | 2011 දෙසැ.05 | 2011 දෙසැ.28 | 1,416,245 | අයහපත් කාලගුණය හා අමු ද්‍රව්‍ය හිඟකම හේතුවෙන් වැඩ ප්‍රමාද වී ඇත. |
| 2. මාන්තායි නැගෙනහිර උපදිසාපති කාර්යාලයේ සම්මන්ත්‍රණ ශාලාව වැඩිදියුණු කිරීම | 710,000, | 2011 දෙසැ.05 | 2011 දෙසැ.28 | 586,833 | |
| 3. ඔඩ්ඩුසුඩාන් උප දිසාපති කාර්යාලයේ නිල නිවාස ඉදිකිරීම | 4,514,000 | 2011 ඔක්. 09 | 2011 දෙසැ.28 | 452,598 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිදන කාමර තුනක් සහිත නිල නිවාසය ඉදිකිරීම | 4,280,000 | 2011 සැප්. 22 | 2011 දෙසැ. 30 | 3,968,460 | අයහපත් කාලගුණය හා අමු ද්‍රව්‍ය හිඟකම හේතුවෙන් වැඩ ප්‍රමාද වී ඇත. |
| 5. | මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිදන කාමර තුනක් සහිත නිල නිවාසය ඉදිකිරීම | 6,803,00 | 2011 සැප්. 27 | 2011 දෙසැ. 30 | 6,713,631 | |

## 4.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළ යුතු ශේෂ

දිස්තක් ලේකම් කාර්යාලය විසින් 2010 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශන වල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව , මාස 6 කට වැඩි හා වර්ෂයකට අඩු කාලයක් වූ රු.2,093,544 ක නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් වූ බව අනාවරණය විය.

## 4.10 පාඩු හා හානි

රු.45,977,461 ක් වටිනාකම වු පාඩු හා හානි තිබූ බව විගණන නියැදි පරීක්ෂණ වලදී හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා තිබුණු තොරතුරු අනුව අනාවරණය විය.

## 4.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | තනතුරු වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 10 | 17 |
| (ii). | ද්විතීයික මට්ටම | 275 | 155 | 120 |
| (iii). | ප්‍රාථමික මට්ටම | 32 | 20 | 12 |
| | එකතුව | 334 | 185 | 149 |

## 4.12 අභ්‍යන්තර පාලනය

### (අ) අභ්‍යන්තර විගණනය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා උප දිසාපති කාර්යාලය විසින් කිසිදු අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### (ආ) විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා උප දිසාපති කාර්යාලවල සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.